ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව** |
| දිනය | **2012 මැයි 21** |

## සේවක අර්ථසාධක අරමුදලේ වංචා යනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු කර ඇති චෝදනා සේවක අර්ථසාධක අරමුදල තරයේ ප්‍රතික්ෂේප කරයි.

සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) කොටස් වෙළඳපොළ ගනුදෙනු වලදී වංචා සිදු කර ඇතැයි දෝෂාරෝපණය කරමින් විරුද්ධ පාක්ෂික පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් කරන ලද චෝදනාත්මක ප්‍රකාශය අලලා වර්ෂ 2012 මැයි මස 15 දින පුවත්පත් කිහිපයක පළවූ වාර්තාව සේවක අර්ථසාධක අරමුදල තරයේ ප්‍රතික්ෂේප කරයි. එකී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින්ම එම ප්‍රකාශයද ඇතුළුව පසුගිය වකවානුව තුළ, කිහිපවරක්ම සිදුකළ මෙබඳුම ප්‍රකාශ සේ.අ.අ. අපකීර්තියට පත් කිරීමටත්, එහි ආයෝජන කටයුතු අධෛර්යමත් කිරීමටත්, කොටස් වෙළඳපොළ බිඳ වැටීමක් ඇති බව හැඟවීමටත් ක්‍රමානුකූලව කරන ලද සැලසුම් බව පෙනී යයි. මෙවැනි නින්දා සහගත, නොමග යවන සුළු ප්‍රකාශයන්හි දේශපාලනික පක්ෂග්‍රාහී බව මොනවට ප්‍රකට වන බැවින් සේ.අ.අ. එවැනි ප්‍රකාශ සඳහා සාමාන්‍යයෙන් ප්‍රතිචාර නොදක්වන නමුත්, රටෙහි විශාලතම විශ්‍රාම අරමුදලෙහි කීර්තිනාමය කෙලෙසීම තුළින් රටෙහි ආර්ථිකය අස්ථාවර කිරීමේ කුට සැලැසුමක් පවතින බව පැහැදිලිවම පෙනී යන නිසා මේ සඳහා ප්‍රකාශයක් නිකුත් කිරීමට සේ.අ.අ. තීරණය කරන ලදී.

අවස්ථා කිහිපයකදීම පැහැදිලි කර දී ඇති පරිදි, සේ.අ.අ. සිය ආයෝජන කළඹින් සියයට 93ක් පමණ රාජ්‍ය සුරැකුම්පත්හි ආයෝජනය කරන අතර ආසන්න වශයෙන් සියයට 6ක් පමණ කොටස් වෙළඳපොළෙහි ආයෝජනය කරනු ලබයි. ඉතිරි සියයට 1 සාංගමික ණයකරයන් සහ අනිකුත් කෙටිකාලීන රාජ්‍ය සුරැකුම්පත්හි ආයෝජනය කරනු ලැබේ. සේ.අ.අ. කොටස් වෙළඳපොළෙහි ආයෝජනයන් සිදු කරනු ලබන්නේ දිගුකාලීනව ලාභ ඉපයීමේ සහ අරමුදලෙහි ප්‍රාග්ධන පදනම පුළුල් කිරීමේ අරමුණිනි. මෙම ක්‍රියාවලියේ දී සේ.අ.අ. සමාගම් කොටස්වල නෛසර්ගික අගය, ඒවායේ දිගුකාලීන අපේක්ෂා, කොටස් මිලෙහි මැදි සහ දිගුකාලීන වර්ධනය, එම සමාගම්හි යහපාලනය, අනාගත සැලසුම්, කොටස් ප්‍රමාණය, අදාළ ක්ෂේත්‍රයෙහි වර්ධනාත්මක ඉඩ ප්‍රස්ථා සහ නැගී එන ආර්ථිකය මගින් සමාගම් වෙත ඇති වන බලපෑම යනාදී කරුණු සැලකිල්ලට ගනු ලබයි.

එමෙන්ම, ලෝකයේ විශාල අරමුදල් සියල්ලක්ම පාහේ ක්‍රියා කරන පරිදි සේ.අ.අ. ද සිය කොටස් ආයෝජන කළඹ විවිධ ආයෝජන රාශියකින් සැදුම්ලත් සංචිතයක් ලෙස පවත්වාගෙන යනු ලබයි. එය බැංකු හා මූල්‍ය, විවිධාංගීකරණය වූ සමාගම්, තෙල් ආශ්‍රිත කර්මාන්ත, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, ඉඩම් හා දේපල, විදුලි සංදේශ, වැවිලි කර්මාන්ත, බලශක්ති, සංචාරක කටයුතු, වෙළඳාම් හා නිෂ්පාදන වැනි කොටස් වෙළඳපොළෙහි ප්‍රධාන ක්ෂේත්‍රයන් නියෝජනය කරන සමාගම් රැසක කොටස් එකතුවකින් සමන්විත වේ.

කොටස් ආයෝජන ගත් කළ අවධාරණය කළයුතු තවත් වැදගත් කරුණක් වන්නේ, ආයෝජන කළඹෙහි අන්තර්ගත විවිධ සමාගම්වල කාර්ය සාධනයන් සහ එකී කොටස්වල වෙළඳපොළ අගය විවිධ කාල පරාසයන්හිදී වෙනස් වන බවත් එය ගෝලීය, ආර්ථික, දේශපාලනික, මූල්‍ය මෙන්ම එකී කර්මාන්ත ක්ෂේත්‍රයට විශේෂිත වූ සහ සමාගමට විශේෂිත වූ සාධක මත රඳා පවතින බවත්ය. එවන් තත්වයක් යටතේ, සමාගම්හි මෙන්ම සමස්ත වෙළඳපොළෙහි ඒකාකාර කාර්ය සාධනයක් නොපවතින අතර කොටස්වල වෙළඳපොළ මිලෙහි ද නිරන්තර වැඩිවීමක් සිදු නොවේ. ඒ අනුව, ඇතැම් වකවානුවලදී යම් යම් කොටස්හි වෙළඳපොළ අගයන් ඒවායෙහි පිරිවැයට වඩා අඩුවෙන් පිළිබිඹු වුවද, කාලානුරූපීව හා බාහිර සාධක සුභවාදී ලෙස වෙනස්වීම මත එකී තත්වයන් ද වෙනස්වනු ඇත. මෙවන් පසුබිමක් තුළ සේවක අර්ථසාධක අරමුදලෙහි කොටස්

ආයෝජන කළඹ සුපරීක්ෂාකාරීව විවිධාංගීකරණය කිරීම හේතුවෙන් දිගුකාලීනව සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ ප්‍රතිලාභයක් නෙලා ගැනීමට හැකිවනු ඇත.

සේ.අ.අ. හි ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩාත් ක්‍රමානුකූලව කරනු වස් වෘත්තීමය නිපුණතාවයන්ගෙන් හා සුදුසුකම් වලින් පිරිපුන් කාර්ය මණ්ඩලයක් විසින් ආයෝජන අවස්ථා විවිධ පැතිකඩයන් ඔස්සේ තක්සේරු කොට සිය නිර්දේශ ඉදිරිපත් කරනු ලබන අතර, එකී ආයෝජන නිර්දේශයන් ඉහළ මට්ටමේ ආයෝජන කමිටුවක් මගින් අනුමත කිරීමෙන් අනතුරුව, මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබාගනු ලැබේ. ඒ අනුව, අරමුදලෙහි සුරක්ෂිතභාවය, ලාභදායීත්වය, ස්ථායී බව සහ වර්ධනය තහවුරු කරනු වස් අවස්ථානුකූල හා සුපරීක්ෂාකාරී ක්‍රියා පිළිවෙතක් අනුව අරමුදලෙහි ආයෝජන කටයුතු සිදු කරනු ලැබේ.

එකී ආයෝජන ප්‍රතිපත්තියෙහි ප්‍රතිඵලයක් ලෙස සේ.අ.අ. සිය කොටස් වෙළෙඳ පොළ ආයෝජන කටයුතු මගින් ප්‍රාග්ධන ලාභ සහ ලාභාංශ ලෙස 2011 වර්ෂයේ දී රුපියල් මිලියන 2,504 ක් ද 2012 වර්ෂයෙහි මේ දක්වා කාලය තුළ රුපියල් මිලියන 1,559 ක් ද උපයා ගැනීමට සමත් වී ඇත. ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කළහොත්, කොළඹ කොටස් හුවමාරුවෙහි සමස්ත කොටස් වෙළෙඳ පොළ මිල දර්ශකය (ASPI) එහි උච්චතම අවස්ථාවන්ට පැමිණි, 2010 අවසාන භාගයේ දී සහ 2011 මුල් භාගයේ දී සේ.අ.අ. විසින් රුපියල් බිලියන 19 ක් පමණ වූ විශාල උපයා නොගත් ප්‍රාග්ධන ලාභයක් සිය කොටස් ආයෝජන කළඹ මත වාර්තා කරන ලදී. එවැනි විශාල ලාභයක් හමුවේ වුවද සේ.අ.අ. හි අදහස වූයේ ඉදිරි වසර 4 හා 5 ක කාලය තුළ රටේ ආර්ථිකයෙහි ඇතිවිය හැකි වර්ධනය මත දීර්ඝ කාලීනව ප්‍රතිලාභ ඉපයීමට ඇති ඉඩ ප්‍රස්ථා සැලකිල්ලට ගනිමින් එකී කොටස් ආයෝජන කළඹෙහි තවදුරටත් රඳවා තබා ගැනීම සුදුසු බවයි.

එබැවින්, වත්මන් කොටස් වෙළෙඳ පොළ පහත වැටීමේ තාවකාලික ප්‍රවනතාවය දඩමීමෙකු කර ගනිමින් මෙකී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් සේවක අර්ථසාධක අරමුදල කෙරෙහි ද්වේශ සහගතව සහ කුරිරු ලෙස කරන ලද ප්‍රකාශ සේ.අ.අ.ට පහර ගැසීමේ ප්‍රයත්නයක් බව සක්සුදක්සේ පැහැදිලිය. එයට හේතුව වත්මන් කොටස් වෙළෙඳ පොළෙහි පවතින තත්ත්වය සේ.අ.අ.ට පමණක් පොදු නොවන එහි ආයෝජනය කළ සෑම ආයෝජකයකුම පාහේ අත්විඳින

තත්ත්වයක් බවත්, ඇතැමෙක් ලාභ අවම වීම හා කොටස් ඇපයට තබා ලබා ගත් ණය සීමා අවම වීම හේතුකොට ගෙන අකමැත්තෙන් වුවද පාඩු විඳිමින් කොටස් විකිණීමට සිදුවන කාලවකවානුවක් වීමත්ය.

එසේ වුවත්, ලොව සියළුම කොටස් හුවමාරුවලට සාමාන්‍ය තත්වයක් වන වෙළෙඳපොළෙහි පහත වැටීමේ නැඹුරුතාවක් පවතින විට පවා මහා පරිමාණයේ ආයතනික ආයෝජකයින් හට තම කොටස් විකිණීමෙන් තොරව රඳවා ගැනීමේ ශක්තිය හා හැකියාව ඇති බැවින් රටෙහි විශාලතම ආයතනික ආයෝජකයෙකු වන සේ.අ.අ.ට ද එලෙසම ක්‍රියා කිරීමේ හැකියාව ඇත. එබැවින්, කොටස් වෙළෙඳපොළෙහි පවතින මෙකී තත්වයේ දී වුවද සේ.අ.අ.ට පාඩු ලැබීමේ කිසිම අවදානමක් නැති බව පැහැදිලිය. එසේම, සිය ආයෝජන කළඹ සතු කොටස්වල නිසඟ වටිනාකමක් ඇති බව සේ.අ.අ. නැවතත් අවධාරණය කරන අතර, කොටස් වල වෙළෙඳ පොළ අගයන් තාවකාලිකව කොටස් පිරිවැයට වඩා පහත වැටී ඇති මුත් සමස්ත කොටස් වෙළෙඳපොළ මිල දර්ශකය ඉහළ යන විට ප්‍රාග්ධන ලාභ හා ලාභාංශ ලබා දීමට සමත් විභවයකින් යුක්ත ඇතැම් කොටස් විකිණීමෙන් තොරව රඳවා තබා ගනු බවත් ප්‍රකාශ කර සිටියි.

එසේම, කුමන ආකාරයක හෝ වංචනික කොටස් වෙළෙඳ පොළ ගනුදෙනුවක් අරමුදල විසින් කර නොමැති බවටත්, සියලුම ගනුදෙනු උපරිම සැලකිල්ලෙන්, කැපවීමෙන් හා වෘත්තීයමය නිපුණතාවයකින් යුතුව ක්‍රියාත්මක කර ඇති බවටත් සේ.අ.අ. දැඩි ලෙස අවධාරණය කර සිටියි. තවද, සේ.අ.අ. හි ආයෝජන ඇතුළු සියලුම ගනුදෙනු රටෙහි පිළිගත් විගණන ආයතනයක් විසින් අභ්‍යන්තරව විගණනය කරනු ලබන අතර, 1958 අංක 15 දරණ සේ.අ.අ. පනතේ 6 (1) වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලබයි. ඒ අනුව, 2010 වර්ෂය සඳහා වූ සේ.අ.අ. හි මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා විසින් විගණනය ලදුව, 2010 වාර්ෂික වාර්තාව විගණකාධිපතිවරයාගේ වාර්තාව ද ඇතුළුව මේ වන විට ප්‍රකාශයට පත් කර ඇත. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව යමින් එම වාර්ෂික වාර්තාවෙහි සේ.අ.අ. හි කොටස් වෙළෙඳපොළ ආයෝජන පිළිබඳ තොරතුරු, කෙටිකාලීන සහ දිගුකාලීන ආයෝජන කළඹයන්හි අඩංගු ආයෝජනයන්, එකී සමාගම්වල නම්, කොටස්වල වටිනාකම් සහ වර්ෂාවසාන වෙළඳපොළ අගයන්ද සහිතව හෙළිදරව් කොට ඇත. එමෙන්ම, 2011 වසර සඳහා වූ

මූල්‍ය ප්‍රකාශයන් 2012 වසරේ පෙබරවාරි මාසය තුළදී විගණන කටයුතු සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර, සාමාජිකයින් ඇතුළු අදාළ පාර්ශ්වයන්ගේ දැනගැනීම සඳහා එම විගණනය නොකරන ලද ආදායම් ප්‍රකාශය හා ශේෂ පත්‍රය 2012 මැයි මාසය මුලදී පුවත්පත්වල පළ කර ඇත.

අරමුදල විසින් විචක්ෂණශීලී ලෙස කරන ලද ආයෝජනයන්ගේ හා මනා කළමනාකරණයේ ප්‍රතිඵලයක් ලෙස 2010 සහ 2011 වර්ෂ වලදී පිළිවෙලින් සියයට 12.5 ක හා 11.5 ක සිත්ගන්නා සුළු වාර්ෂික පොලී අනුපාත ප්‍රකාශයට පත් කිරීමට සේ.අ.අ.ට හැකි විය. එම පොලී අනුපාත එකී වර්ෂවල මූල්‍ය වෙළෙඳ පොළෙහි සාමාන්‍ය තැන්පතු සඳහා ගෙවනු ලැබූ පොලී අනුපාතයන්ට වඩා සැලකියයුතු ලෙස ඉහළ මට්ටමකි. තවද, ස්වකීය ආයෝජන තීරණ ප්‍රායෝගික වූත් යෝග්‍ය වූත් ලාභදායී වූත් තීරණ බව ඉදිරියේ දී සනාථ වනු ඇතැයි සේ.අ.අ. විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කර සිටින අතර එබැවින්, මෙවැනි නින්දාසහගත, දේශපාලන පෙළඹීම් සහිත අසුභවාදී ප්‍රචාර මගින් නොමග නොයන ලෙස එහි ලක්ෂ සංඛ්‍යාත සාමාජිකයින් සහ පාර්ශ්වකරුවන් වෙත සේ.අ.අ. වගකීමෙන් යුතුව දන්වා සිටියි.